

# කෙස් කළඹක සැගවුණු පුරාවෘත්තය

විතුල්‍යා කුලප්පුආරච්චි
සවිද්‍යා වික්‍රමසිංහආරච්චි
ලිතුම් කොඩිතුවක්කු
මියැසි සේනාධීර

# කෙස් කළඹක සැඟවුණු පුරාවෘත්තය


**විතුල්යා කුලප්පුආරච්චි**

**සවිද්‍යා වික්‍රමසිංහආරච්චි**

**ලිතුම් කොඩිතුවක්කු**

**මියැසි සේනාධීර**

කතෘන්

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2026 (12 ශ්‍රේණිය)



**කවර නිර්මාණය සහ සිතියම - සවිද්‍යා වික්‍රමසිංහආරච්චි**

ප්‍රකාශිත දිනය 2026-07-19

ISBN 978-624-211-499-5

# පිදුම

මහනුවර මහාමායා බාලිකා විදුහලේ ශශිකලා සේනාධීර විදුහල්පතිතුමියටත්, ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක සෙනෙවිරත්න මහලේකම් සර්ටත්, මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ පුස්තකාලාධිපතිතුමා අජන්ත සමරකෝන් මහතාටත්, පුස්කොළපොත් ත්‍රිපිටක සංරක්ෂණ ව්‍යාපෘතියේ සමාජික ඩී. එම්. ජයවර්ධන මහතාටත්, මහාමායා බාලිකාවේ ව්‍යාපෘතිභාර ගුරුතුමියන්ටත්, පුස්තකාලභාර ගුරුතුමියන් ඇතුළු සංවිධානය මණ්ඩලයටත්, අපගේ දෙමාපියන්ටත් මෙම අවස්ථාව ලබා දීම සහ මගපෙන්වීම වෙනුවෙන් ගෞරවනීය ස්තූතිය.

අකුරු කියාදුන් සියළුම ගුරුවරුන්ට යහළුවන්ට නෑදෑයින්ට සහ සමස්ත ලංකාවාසී සියළුම දෙනාටත් මේ කුඩා උත්සාහය ආදරයෙන් පිදේ..

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර,

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය.

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතයි තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබු භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්, ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
**2026-05-10**

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව

# පටුන

1. හැඳින්වීම

2. හේමමාලා කුමරියගේ ජීවන තොරතුරු

3. ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ වංශකතාගත පෙර පුවත

4. හේමමාලා ගමන් මග

5. දන්ත ධාතූන් වහන්සේ භාරදීමෙන් පසු ඔවුන්ගේ ජීවිතය

6. වර්තමාන සමාජය තුළ හේමමාලා කුමරිය ඇගයීමට ලක්වන ආකාරය

7. හේමමාලා කුමරිය මෙසේ ඇගයීමට හේතු

# හැඳින්වීම

ශ්‍රී ලාංකීය සමාජ දේශපාලනික සහ සංස්කෘතික ඉතිහාසය හැඩගැන්වීමෙහිලා සුවිශේෂීම සාධකයක් බවට පත් වූයේ බුදුරජාණන් වහන්සේගේ වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ලක්බිම ආගමනයයි. ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසේ දී සිදු වූ මෙම ඓතිහාසික සංසිද්ධිය හුදෙක් ආගමික පවුතක් පමණක් නොව ශ්‍රී ලංකාවේ රාජ්‍යත්වයේ සංකේතය තීරණය කළ ප්‍රධානතම හැරවුම් ලක්ෂ්‍ය ද වෙයි.

මහාවංශය සහ දාඨාවංශය වැනි දේශීය වංශකතා සාක්ෂි දරණ පරිදි, මෙම භාරධූර සහ අන්තරාය කර කාර්යය ඉටු කරන ලද්දේ කාලිංග දේශයේ සිට පැමිණි හේමමාලා කුමරිය හා දන්ත කුමරු විසිනි.

කෙසේ වුවද, ලක්දිව සමස්ත ආගමික හා දේශපාලන ඉරණම වෙනස් කළ මෙම මහා මෙහෙවරෙහි **සැබෑ උරුමකාරිය වූ හේමමාලා කුමරිය** පිළිබඳව වංශකථාවල මෙන්ම නූතන ඓතිහාසික විචාරයන් තුළද ප්‍රමාණවත් ශාස්ත්‍රීය ඇගයීමක් සිදු වී නොමැති බව පෙනී යයි. සම්ප්‍රදායික ඉතිහාසකරණයේ පවතින පුරුෂ මූලික ආඛ්‍යාත රටාවන් හේතුවෙන් දනත් ධාතූන් වහන්සේගේ ආගමනය වැනි දැවැන්ත කාර්යයකදී කාන්තාවක ලෙස ඇය දැක්වූ අසමසම ධෛර්යය තීරණ ගැනීමේ හැකියාව හා ජීවිත පරිත්‍යාගය ඉතිහාසයේ පිටු අතර බොහෝ දුරට අවතක්සේරුවට හෝ නොසලකා හැරීමට ලක්ව ඇත. ඇයට හිමිවිය යුතු ජාතික උපකාරය සහ ඇගයීම ඉතිහාසය තුළ මෙලෙස අඩු වීමට ඇගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සෘජුවම බලපා ඇති ආකාරය නිරීක්ෂණය කළ හැක.

එබැවින් මෙම පරීක්ෂණ කෘතිය මගින් මූලිකවම උත්සහා කරනු ලබන්නේ සම්ප්‍රදායික ආගමික රාමුවෙන් ඔබ්බට ගොස් හේමමාලා කුමරියගේ ඓතිහාසික භූමිකාව ස්ත්‍රීවාදී හා විවේචනාත්මක දෘෂ්ටි කෝණයෙන් නැවත කියවීමට ලක්කිරීමයි. එමෙන් ම ඉතිහාසය විසින් ඇයට හිමි කරන ලද නිසි ශාස්ත්‍රීය සහ සංස්කෘතික ඇගයීම නැවත ස්ථාපිත කිරීමද මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණක් වෙයි.

# හේමමාලා කුමරියගේ ජීවන තොරතුරු

නම - හේමමාලා කුමරිය

(දඨා වංශය, දළදා සිරිත වැනි ඇතැම් මූලාශ්‍ර වලදී ද ඇතැම් අවස්ථාවලදී ද ඇයව හඳුන්වා ඇත්තේ "හේමමාලි කුමරිය" ලෙසයි.

හේමමාලා යන්නෙහි අරුත "රන් මාලය" යන්නයි.)

මව -වංශකතාවල ඇගේ නම පිළිබඳව සාජුවම නමක් සඳහන් නොවන අතර ඇය කාලිංගදේශයේ අග්‍ර මහීෂිකාවයි.

පියා - කාලිංග දේශයේ (වත්මන් ඉන්දියාවේ ඔඩීෂා ප්‍රාන්තය) අගනුවර පාලනය කළ ගුහසීව රජතුමා

සහකරු - උදේනි පුරයේ රාජකීය පවුලකට අයත් වූ දන්ත කුමරු.

(දන්ත ධාතුන් වහන්සේ වන්දනා කිරීමට පැමිණි අවස්ථාවේදි ගුහසිව රජුගේ පැහැදීමට ලක්ව හේමමාලා කුමරියව ඔහුට විවාහ කර දෙන ලදි.)

## දන්ත ධාතුව රැගෙන එන විට හේමමාලා කුමරියගේ වයස -

වංශකතාවල ඇගේ නිශ්චිත උපන් වර්ෂය සටහන් කර නොමැති වුවද, දන්ත ධාතුන් වහන්සේගේ ආගමනය සිදු වූ ක්‍රිස්තු වර්ෂ 4 වන සියවසේ (කිත්සිරිමෙවන් රජුගේ 9 වන රාජ්‍යය වර්ෂයේදී වූ ඓතිහාසික සිදුවීම් විශ්ලේෂණය කිරීමේදී, දන්ත ධාතුව ලක්බිමට වැඩම කරවන විට ඇය (අවුරුදු 16 ත් 25 ත් අතර) තරුණ වියේ පසු වූ කාන්තාවක බව නිගමනය කළ හැකයි . දන්තපුරය ආක්‍රමණය කළ හින්දු රජවරුන්ගෙන් දන්ත ධාතුව බේරාගෙන, තම පියා යුධ බිමේදී මියයන බව දැන දැනම මෙවැනි භාරදූර රාජ්‍ය තාන්ත්‍රික මෙහෙයුමකට ඇය නායකත්ව ය දුන්නේ තම ජීවිතයේ වඩාත්ම සුවිශේෂි තරුණ අවධියේදී ය.

## ඇය ඉතිහාසය තුළ වැදගත් වීමට හේතු -

- **රාජ්‍යත්වයේ උරුමය තීරණය කිරීම**

ශ්‍රී ලංකාවේ සිහසුනේ පරම අයිතිය " දන්ත ධාතූන් වහන්සේ හිමි තැනැත්තාට හිමිවේ." යන දේශපාලන හා සංස්කෘතික සංකල්පය මෙරට ස්ථාපිත කිරීමට මඟ පෑදීම.

- **අසීරු උපායමාර්ගික මෙහෙයුම**

කාලිංගයේ ඇති වු දේශපාලන අර්බුද මැද දන්ත ධාතුව සතුරන්ගෙන් බේරා ගැනීම සඳහා, තම **කේශ කලාපය** (හිසකෙස් කළඹ) තුළ එය ආරක්ෂිතව සඟවාගෙන, රාජකීය සැප සම්පත් හැර දමා බ්‍රාහ්මණ වෙස් ගෙන භාරතයේ සිට ලංකාව දක්වා වූ අන්තරායකර ගමනේ ප්‍රධාන වගකීම් දැරීම.

## ගතිගුණ සහ චරිත ලක්ෂණ -

සතුරන්, චෝර භීතිකාවන් (හොරුන්) සහ ඝණ වනාන්තරය පිරුණු මාවත් ඔස්සේ වෙස්වලාගෙන මඟ පෙන්වන්නන් රහිතව සැතපුම් සිය ගණනක් ගමන් කිරීම ට තරම් දැඩි මානසික සහ කායික ශක්තියක් ඇය සතු විය.

දන්ත ධාතු කාන්තාවකගේ හිසකෙස් තුළ සැඟවීමට තීරණය කිරීම ම අතිශය සූක්ෂම උපක්‍රමයකි. මන්ද එකල සමාජ ව්‍යුහය තුළ කාන්තාවකගේ ශරීරය මෙවැනි දේශපාලන සෝදිසි කිරීම්වලට ලක්වීමේ ප්‍රවණතාව අඩු බව ඇය වටහාගෙන තිබීම ඇගේ තේරුම් ගැනීමේ බුද්ධිය ප්‍රකට කරයි.

මුළු ගමනම ශ්‍රද්ධාව පෙරදැරි කරගෙන සිදුකළ අතර, දන්ත කුමරු සමග පැමිණියද දන්ත ධාතුවේ ප්‍රධාන සඟවන ස්ථානය සහ වගකීම ඇය
දැරීම තුළින් ඇගේ නායකත්ව ගුණය මැනවින් පෙනේ.

# ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ වංශකතාගත පෙර පුවත

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු විසින් දන්ත ධාතූන් වහන්සේ ලක්බිමට වැඩම කරවීමට පෙර, එම උත්තරීතර වස්තුව භාරත දේශය තුළ දේශපාලනික හා ආගමික හැලහැප්පීම් රැසකට ලක්විය.

- **දන්ත ධාතුවේ ප්‍රභවය සහ පළමු තැන්පත් කිරීම**

බුදුරාජාණන් වහන්සේගේ මහා පරිනිර්වාණයෙන් පසු ආදාහන චිතකය දැවෙමින් පවතින අවස්ථාවේදී ම, "ඛේම මහරහතන් වහන්සේ" විසින් තමන් වහන්සේගේ සෘද්ධි බලයෙන් වාම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේව චිතකයෙන් වැඩම කරවා ගන්නා ලදි.

ඛේම රහතන් වහන්සේ විසින් මෙම උත්තරීතර දන්ත ධාතුව එකල කාලිංග දේශයේ පාලකයා වෙත භාරදෙන ලදි.

කාලිංග රජු විසින් දන්ත ධාතූන් වහන්සේ නව රුවනින් (රත්න නවයකින්) බැඳි කුඩා කරඬුවක තැන්පත් කර මාලිගාවක් කරවා පුද පූජා පැවැත්වූ අතර, එම ප්‍රාථමික කරඬුව අදටත් මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ සුරක්ෂිතව පවතියි. එම රාජකීය නගරය එතැන් සිට **"දන්තපුරය"** ලෙස ඉතිහාසගත විය.

- **දන්ත ධාතුව සුරැකි අනුගාමී පාලකයෝ**

කාලිංග දේශයේ දන්තපුරය කේන්ද්‍ර කරගනිමින් දන්ත ධාතූන් වහන්සේ සහ රාජ්‍යත්වයේ උරුමය රැකගත් ප්‍රධාන රජවරුන් තිදෙනෙකි.

1. කසී රජතුමා
2. සීනන්ද රජතුමා
3. ගුහසීව රජතුමා

ගුහසීව රජතුමා මුල් අවධියේ දී නිගණ්ඨයන්ගේ බලපෑමට ලක් වූ මිථ්‍යාදෘෂ්ටික පාලකයෙකු ලෙස කටයුතු කළ ද, පසුව දළදා වහන්සේගේ හා බුදුදහමේ සත්‍යතාව වටහාගෙන සම්පූර්ණයෙන් ම බුද්ධානුශාසනාවට අනුව හැසිරෙන දැඩි බෞද්ධයෙකු බවට පත් විය. ඉන්පසු තමන්ව මුලා කළ මිථ්‍යාදෘෂ්ටික නිගණ්ඨයන් සියලු දෙනා තමන්ගේ රාජ්‍යයෙන් නෙරපා හැරීමට රජු කටයුතු කළේ ය.

රාජ්‍යයෙන් නෙරපු නිගණ්ඨයන් භාරතයේ මහා අධිරාජයා වූ පැළලුප් නුවර (පාටලී පුත්‍ර) පාණ්ඩු රජුවෙත ගොස් කේලාම් කීමත් සමඟ දන්ත ධාතුව ට සහ ගුහසීව රජුට මහා උවදුරු මතු විය.

නිගණ්ඨයන්ගේ කේලාම් ඇසු පාණ්ඩු රජු කෝපයට පත්ව, "සිවුරඟ සේනාව සමඟ කාලිංග රටට ගොස් ගුහ සීව රජු සහ ඔහු අදහන **මිනී ඇටය** (දළදාව) වහාම අත්අඩංගුවට ගෙන පැලලුප් නුවරට ගෙන එන්න." යන භාරදූර අණ තම ප්‍රධාන සෙන්පතියා වූ 'චිත්‍රයාන' වෙත පැවරිය.

ලැබුණු අණ පරිදි චිත්‍රයාන සෙන්පතියා තම සේනාව සමඟ කාලිංග දේශයට ඇතුළු වූ මුත්, එහිදී දළදා වහන්සේ පිළිබඳව පැතිර තිබු අද්භූත හා ආශ්චර්යමත් පුවත් ඇසීමෙන් ඔහුගේ සිත තුළ බලවත් පැහැදීමක් ඇති විය. දළදා මහිමය හමුවේ චිත්‍රයාන සෙන්පතියා සහ ඔහුගේ සමස්ත පිරිවරම මිථ්‍යා දෘෂ්ටිය අත්හැර බුදු සමය වැළඳ ගැනීමට ක්‍රියා කළහ. ඉන්පසු ආක්‍රමණිකයෙකු ලෙස නොව, යුක්තියට ගරු කරන විනීත බෞද්ධයෙකු ලෙස ක්‍රියා කළ චිත්‍රයාන, දළදා වහන්සේ අලංකාර රාජකීය රථයක වඩා හිඳුවා, මහා පූජා පෙරහැරකින් යුතුව ගුහ සීව රජු සමඟ සාමකාමීව පාණ්ඩු රජු ඉදිරියට ගමන් කළේය.

- ## පාණ්ඩු රජු ඉදිරියේ මුහුණ දුන් උවදුරු සහ දළදා ප්‍රාතිහාර්යයන්

පාණ්ඩු රජු ඉදිරියේදී දළදා වහන්සේ විනාශ කරීම සඳහා මිථ්‍යාදෘෂ්ටිකයන් විසින් ප්‍රධාන උවදුරු දෙකක් සංවිධානය කරන ලදි.

☞ පළමු උවදුර - කිහිරි අඟුරු වළක ලා දැවීම : නිගණ්ඨයන්ගේ උපදෙස් මත පාණ්ඩු රජු දළදාව කහිරි අඟුරු ගොඩක ලා පුලුස්සා අලු කරන ලෙස අණ කළේය. නිගණ්ඨයන් රජ මිදුලේ විශාල වළක් කපා ගිනිබත් කර දළදාව ඊට දැමූහ.

**ප්‍රාතිහාර්යය :** ගිනිදැල් පීරාගෙන රිය සකක් පමණ වූ මහ පියුමක් (නෙළුම් මලක්) පැන නැගී දළදා වහන්සේව පිළිගත්තේය. මේ දැක දහස් ගණන් ජනයා මිථ්‍යා දෘෂ්ටියෙන් හළහ.

☞ **දෙවන උවදුර** - කිණිහිරයක් මත තබා කුළුගෙඩි පහර දීම : පියුම මත වැඩ සිටීම දේව භාස්කමක් බව නිගණ්ඨයන් පැවසූ බැවින්, දළදාව කුඩු කිරීමට කිණිහිරයක් මත තබා කුළුගෙඩියෙන් තැලීමට රජු අණ කළේය.

**ප්‍රාතිහාර්යය :** කුළුගෙඩි පහරින් දළදාව සුණු විසුණු නොවූ අතර, කිණිහිරය විවර කරගෙන ඊට ඇතුළතින් කාවැදී නොතැලී, නොසැලී වැඩසිටි බැවින් ප්‍රතිවාදීන්ට එය සෙලවීමටවත් නොහැකි විය.

- **සුභද්‍ර සිටු පුත්‍රයාගේ සත්‍ය ක්‍රියාව**

කිණිහිරයේ හිරවූ දළදාව මෑත්කර දෙන කෙනෙකුට මහත් යස ඉසුරු දෙන බවට රජු ප්‍රකාශ කළේය. එහිදී අනේපිඩු මහ සිටුතුමාගේ මී මුණුබුරු වූ " සුභද්‍ර සිටුපුත්‍රයා" ඉදිරිපත් විය.

**ප්‍රාතිහාර්යය :**

ඔහු දළදා වහන්සේ ඉදිරියේ පසඟ පිහිටුවා වැඳ, සර්වඥ ධාතු බල මහිමය උදෙසා ප්‍රබල සත්‍ය ක්‍රියාවක් සිදු කළේය. ඒ අනුව දළදා වහන්සේ කිණිහිරයෙන් මෑත්ව අහස් කුසට නැගී මහා පෙළහර පෑ සේක.

භාරත දේශය තුළ දනත් ධාතූන් වහන්සේ මුහුණ දුන් මෙම දාෂ්ටිමය සහ යුධමය උවදුරු හේතුවෙන්, දන්ත ධාතුවේ ආරක්ෂාව තවදුරටත් භාරතය තුළ තහවුරු කළ නොහැකි බව ගුහසීව රජු වටහා ගත්තේය. මෙම දේශපාලන අස්ථාවරත්වයේ අවසාන ප්‍රතිඵලය වූයේ, **දළදා වහන්සේ ආරක්ෂිත බෞද්ධ රාජ්‍යයක් වූ ශ්‍රී ලංකාව වෙත යැවීමට තීරණය කිරීම සහ එහි භාරකාරීත්වය තම දියණිය වූ හේමමාලා කුමරියට පැවරීමයි.**

# හේමමාලා ගමන් මග



මාලිගයෙන් ගමන් ආරම්භ කර ඇත. ඔවුන් සතුරන්ගෙන් මිදීම සඳහා බමුණු වෙස් ගෙන පිටත් වුහ. තවද අතිශය සුක්ෂම උපක්‍රමයක් ලෙස හේමමාලා කුමරිය දළදා වහන්සේ ඇයගේ කෙස් කලඹ තුල සඟවාගෙන ඇත. ඒ අනුව ඔවුන් දෙදෙනා කාලිංග දේශයෙන් පිටත් වූ මොහොතේ සිටම ධාතූන් වහන්සේ ඇයගේ කෙස් කළඹේ සඟවාගෙන තිබුණි. ධාතූන් වහන්සේ සතුරු නිලධාරීන් මඟින් පරීක්ෂා කරනවිට, කාන්තාවන්ගේ කෙස් කලඹ පරීක්ෂා කිරීම අල්ප වීමත්, ගමන පුරාම දැතින් රැගෙන යාම සැකයට කාරණයක් බැවින් කෙස් කලඹ තුළ රඳවා ගැනීමත්, හිස යනු ශරීරය ඉහළම කොටස බැවින් ධාතූන් වහන්සේට ගෞරවයක් ලෙසත් යන හේතුන් කරන කොට ගෙන හේමමාලා කුමරිය දන්ත ධාතූන් වහන්සේ ඇගේ කෙස් කළඹ තුළ සඟවා ගන්නට ඇති බව දැක්විය හැකයි.

නමුත් ගමන පුරාවටම ධාතූන් වහන්සේ හේමමාලා කුමරියගේ කෙස්කලඹ තුළම නොතිබූ අවස්ථා දාඨාවංශයේ දැක්වේ. හේමමාලා කුමරිය සහ දන්ත කුමරු රාත්‍රියේ රහසිගතව නවාතැන් ගන්නා විට ධාතූන් වහන්සේ උදෙසා පුද පූජා පැවැත්වීමට හේමමාලා කුමරියගේ කෙස් කලඹෙන් ඉවතට ගෙන වැඳපුදා ගත් බව සඳහන් වෙයි. මහජනයා ගැවසෙන සහ අනාරක්ෂිත ස්ථානවලදී ඇය නැවත ධාතූන් වහන්සේ තම කෙස් කළඹේ සඟවාගෙන ඇත.

## ගොඩබිම් ගමන

මේ අයුරින් හේමමාලා කුමරිය සහ දන්ත කුමරු දන්ත ධාතූන් වහන්සේ සුරක්ෂිතව වැඩම කළාවූ ගොඩබිම් ගමනේ විස්තරය මෙසේ ය.

*"කාලිංග පුරයෙන් නික්ම... මහත් ඉතා වැලි පිරුණු වූ ගංගා නම් ගඟෙන් එතෙරවම*

*(වන්නි රාජාවලිය)*

කාලිංග දේශයේ සිට නැගෙනහිරට වන්නා වූ සැතපුම් 250 සිට 300 දක්වා ( කිලෝමීටර් 400- 480) පමණ වූ ගංගා නම් නදියෙන් එතෙර වූ බව වන්නි රාජාවලිය සාක්ෂි දරයි. හේමමාලා කුමරියට සහ දන්ත කුමරා හට මෙම දුර ප්‍රමාණය ගෙවා දැමීමට සති කීපයක් ගතවන්නට ඇතැයි සැලකේ. මේ ගොඩබිම් ගමනේ දී ස්වභාවික බාධකවලට මුහුණ දීමට ඔවුන් දෙපළට සිදුවිය. ගමන තුළදී ඝන වනාන්තර, කුඩා ගංගා පසු කිරමින් නොබියව පෙරටම පියනගා ඇත. එහිදී වනසතුන්ගේ ගහන, වනාන්තර මැදින් ගමන් කිරීමේදී ඔවුන්ගේ ජීවිතවලට දැඩි තර්ජනයක් එල්ල විය. ඔවුන් හට මග වැරදුන් අවස්ථාවකදී අසල වූ ජලාශයක රන්වන් පැහැති මාළුවෙකු ජලයේ පිහිනමින් ඔවුන්ට නිවැරදි මාර්ගය පෙන්වා දුන් බවත් එම මාර්ගය ඔස්සේ සුරක්ෂිතව තම ගමනාන්තයට ළඟා වු බව අතීත මුලාශ්‍රවල විස්තර කොට ඇත.

රාත්‍රී කාලයේ දී වනාන්තරවල ලැගුම් ගන්නා විට ධාතූන් වහන්සේගේ ආරක්ෂාව වෙනුවෙන් ඔවුන් නිරන්තර අවධානයෙන් පසුවූහ. ඇතැම් අවස්ථාවලදී වැලිගොඩවල් තුළ ධාතූන් වහන්සේ සඟවා තබා වැඳපුදාගත් බව සඳහන් වෙයි.

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු ගංගා නම් නදියෙන් එතෙර ව වානාන්තර පසු කරමින් දුෂ්කර පා ගමනකින් තාම්‍රලිප්ති වරායට ළඟාවී ඇත.



(මේ සඳහා පර්යේෂණ සාක්ෂි ලෙස හේමමාලා දන්ත කුමරු වරායෙන් නැවු නැගී වෙරළ දිගේ ගමන් කරන අවස්ථාව කැලණි විහාරයේ සෝලියස් මෙන්දිස් ශිල්පියාගේ පැරණි සිතුවම් පෙන්වා දෙනු ලැබේ.)

## මුහුදු ගමන

තාම්‍රලිප්ති වරායෙන් (වර්තමාන ඉන්දියාවේ බටහිර බෙංගාලය) ආරම්භ වූ හේමමාලා කුමරියගේ සහ දන්ත කුමරුගේ මුහුදු ගමන දළදා ඉතිහාසයේ අතිශය ආශ්චර්යමත් මෙන්ම භයානක අවස්ථාවන්ගෙන් පිරුණු බව දාඨාවංශ සහ ජනප්‍රවාදවලින් පෙනීයයි.

නැගෙනහිර වෙරළේ පහිටි තාම්‍රලිප්ති වරායට පැමිණි හේමමාලා කුමරිය සහ දන්ත කුමරු ලක්දිව බලා යන වෙළඳ නැවකට ගොඩ වී ඇත. සතුරු රජුගේ ඔත්තුකරුවන් මුහුදේ සැරිසැරූ බැවින් ගමන පුරාම දැඩි අවදානමක් ඔවුනට එල්ල විය. හේමමාලා කුමරිය සහ දනත් කුමරු ගොඩවූයේ ලීයෙන් සාදන ලද, රුවල් ආධාරයෙන්,සුළං බලයෙන් ක්‍රියා කරන, දාඨාවංශයේ සදහන් පරිදි **"මහ නැවක"** ය. හේමමාලා කුමරිය සහ දන්ත කුමරු මෙම සජීවී වෙළඳ නැවේ සාමාන්‍ය මගීන් ලෙස වෙස්වලාගෙන සිටි නිසා ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු විය. මෙම මුහුදු ගමනේදී ඔවුනට සෘතුමය බලපෑම් එල්ල විය. තාම්‍රලිප්ති වරාය සිට ඉන්දියන් සාගරයේ බෙංගාල බොක්ක හරහා යාත්‍රා කිරීමේ දී දරුණු කුණාටු තත්වයකට නැව හසු වූ බව ජනශ්‍රැතියේ සඳහන් වෙයි. විශාල රළ පහරවල් වලින් නැව අනතුරට පත්වීමේ මහත් තර්ජනයක් ඔවුනට මතුවිය.

තවද මෙම මුහුදු ගමන අතරතුරේ දි ධාතූන් වහන්සේගේ ප්‍රභාව දුටු පණ්ඩුහාර නම් නාග රාජයා ධාතූන් වහන්සේ කෙරෙහි පැහදී, එය තමා සතු කර ගැනීමට සිත් පහළවිය. නාග රාජයා සෘද්ධි බලයෙන් නැව ගමන් නොකරන ලෙස මුහුද මැද නතර කර ධාතූන් වහන්සේ රහසින් පැහැරගෙන තම නාග ලෝකයට රැගෙන ගිය බව දාඨාවංශයේ ගම්‍ය වේ.

ධාතූන් වහන්සේ අතුරුදහන් වී ඇති බව දැනගත් හේමමාලා කුමරිය සහ දන්ත කුමරු දැඩි ලෙස චිත්ත පීඩාවට පත් විය. එවිට ඔවුන්ගේ ආරක්ෂාවට තෙරණුවෝ (රහතන් වහන්සේ නමක්) තම සෘද්ධි බලයෙන් නාග ලෝකයට වැඩම කර , නාගයන් දමනය කර ධාතූන් වහන්සේ වැඩමවාගෙන හේමමාලා කුමරියට භාර දුන් බව දාඨාවංශය තවදුරටත් මේ පළිබඳව කරුණු අනාවරණය කරයි.

හේමමාලා කුමරියගේ සහ දන්ත කුමරුගේ දේශාටනයේ දී කුණාටු අවස්ථාවලදී හා මග වැරදෙන අවස්ථාදලදී දෙවියන් විසින් නැව ආරක්ෂිතව ලක්දිව දෙසට මෙහෙයවූ බව ඉතිහාස පුවත් මඟින් සනාථ කෙරේ. රාත්‍රී කාලයේදී ධාතූන් වහන්සේ නිකුත් වූ ෂඩ්වර්ණ රශ්මි මාලාවන් නිසා මුහුදු ජලය බැබලුනු බවද මනාව පිළිඹිබු කරයි.

හේමමාලා කුමරිය සහ දන්ත කුමරු අවසානයේ දී සියලු බාධක ජය ගෙන නිර්භීතව මුහුණ දී කැපවීමෙන් සාර්ථක ලෙස ලක්දිව කරා සේන්දු වීමට සමත් විය. ක්‍රි.ව 310 දී ලක්දිව ලංකාපට්ටන (වර්තමාන ඉලංකාතුරෙයි) වරායට ළඟා විය. සාමානයෙන් තාම්‍රලිප්ති වරායේ සිට ලංකාපට්ටන දක්වා වූ මුහුදු මාර්ග අනුව ඔවුනට දින 7 සිට 14 දක්වා කල් ගත වන්නට ඇතැයි සැලකේ. හේමමාලා කුමරිය සහ දන්ත කුමරු ලක්දිව ගොඩබිමට පය තැබූ වහාම දළදා වහන්සේ කෙස් කළඹෙන් ඉවතට ගෙන වැලි ගොඩක් මත තබා පුදපූජා කර ඇත.පසු කාලයකදී එම ස්ථානයේ විහාරයක් ඉදි වූ බවත් පැවසේ.

## දළදා ගමන් මග

### ■ අනුරාධපුර යුගය

හේමමාලා කුමරිය සහ දන්ත කුමරා ධාතූන් වහන්සේ වැඩමවාගෙන ශ්‍රී ලංකාවේ ලංකාපට්ටන (වර්තමාන ඉලංගතුරෙයි) වරායට ළඟා වූයේ කිත්සිරිමෙවන් (කීර්ති ශ්‍රී මේඝවර්ණ) රජදවසෙයි . (ක්‍රි.ව.301-328) දළදා වහන්සේ රැගෙන ආ හේමමාලා කුමරිය සහ දන්ත කුමරු ද, රජු සමඟ වැඩමකල කලපුග නම් භික්ෂූන් වහන්සේ නමක් විසින් ද දළදාවේ සැක දුරුකල පසුව, භික්ෂූන් වහන්සේලා විසින් ඔවුන්ව පිළිගෙන දළදා ධාතූන් වහන්සේ ස්වර්ණමය පාත්‍රයක සුරක්ෂිතව තැන්පත් කරන ලදී.



**දාඨාවංශය සහ දළදා සිරිත වැනි මූලාශ්‍රවල සඳහන් පරිදි හේමමාලා කුමරිය සහ දන්ත කුමරු පළමු ලංකාවේ දළදා වහන්සේ තැන්පත් කර ඇත්තේ මේඝගිරි විහාරයේ ය. ලංකා පොළොවේ දළදා වහන්සේ මුලින්ම තැන්පත් කළ ඓතිහාසික ස්ථානය වන්නේ ද මෙය වේ.**

කිත්සිරිමෙවන් (කීර්ති ශ්‍රී මේඝවර්ණ) රජු භික්ෂූන් වහන්සේලාගෙන් දළදා වහන්සේ තැන්පත් කල පුවත දැනගෙන මහත් සතුටට පත් විය. කිත්සිරිමෙවන් රජු විසින් දළදාව රැගෙනවිත් තම මාළිගා පරිශ්‍රයේ පහිටි දේවානම්පියතිස්ස රජු විසින් ඉදි කර තිබූ **"ධම්මචක්ක ගේහය"** තුළ දළදා වහන්සේ නිල වශයෙන් තැන්පත් කර ඇත. දාඨාවංශය, මහාවංශය සහ චීන ජාතික දේශාටන වාර්තා වලට අනුව, දළදා වහන්සේ ධම්මචක්ක ගේහයේ (ප්‍රථම දළදා මාළිගාව) තැන්පත් කර පසු ජන භාරකාරත්වයට සහ ආරක්ෂාවට අභයගිරි විහාරයේ මහා සංඝරත්නය වෙත පවරන ලදී.

එම නිසා අභයගිරි විහාරය ඉතා බලවත් මෙන්ම ජාත්‍යන්තර සබඳතා පැවැත්වූ ප්‍රධාන ආගමික කේන්ද්‍රස්ථානයක් විය. දළදා වහන්සේ, ලාංකීය ජනතාවට වන්දනා මාන කිරීමට කිත්සිරිමෙවන් රජු විසින් චාරිත්‍ර සමුදායක් ආරම්භ කරනු ලැබීය.



*අභයගිරි විහාරය*

**මහජන ප්‍රදර්ශනය** - සෑම වසරකම, මූලාශ්‍රවල සඳහන් පරිදි ඇසළ මාසයේ දී දළදා වහන්සේ ධම්මචක්ක මන්දිරයේ සිට ඉතා උත්කර්ෂවත් පෙරහැරකින් අභයගිරි විහාරය වෙත වැඩම කර ඇත.

**දින අනූවක පූජාව** - අභයගිරි විහාරයේ විශේෂයෙන් ඉදි කරන ලද මන්දිරයක දළදා වහන්සේ තැන්පත් කර, දින අනූවක් පුරා මහජනතාවට වන්දනාමාන කිරීමට ප්‍රදර්ශනය සඳහා විවෘත කර තැබූ බව ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන්ය.

- **පාහියන් හිමියන්ගේ ඇසින් දුටු සාක්ෂි**

**චීන ජාතික පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව තුළ උන්වහන්සේ අනුරාධපුරයේ පැවති දළදා පෙරහැර සියැසින් දර්ශනය කලා විය හැකිය.**

*"පෙරහැර ආරම්භ වීමට දින 10කට පෙර, රජතුමා විසින් මාර්ගයේ සරසන ලද ඇතෙකු පිට නැගුණු නිලධාරියෙකු ලවා නගරය පුරා අණබෙර යවනු ලබයි. ඔහු බුදුරජාණන් වහන්සේ ගුණ සහ පෙරහැර සිදුවන ආකාරය ජනතාවට ප්‍රකාශ කරයි. ඉන්පසු අනුරාධපුර නගරයේ සිට අභයගිරි විහාරය දක්වා යන මාර්ගය දෙපස බුදුන් වහන්සේ පෙර ආත්ම භවයන් නිරූපණය කරන විසිතුරු රූප 500ක් ප්‍රදර්ශනය කෙරේ. රජතුමා ඇතුළු සමස්ත ලාංකිකයන් සුවඳ මල් හා සුවඳ දුම් පූජාව කරමින් දළදා වහන්සේ අභයගිරි විහාරයට වැඩමවති."*

**(චීන ජාතික පාහියන් හිමියන්ගේ දේශාටන වාර්තාව)**

**කිත්සිරිමෙවන් රජුගෙන් පසුව ක්‍රි.ව. 5 වන සියවසේදී බලයට පත් වූ පළමුවන උපතිස්ස රජතුමාගේ රාජ්‍ය සමයේදී, පළමුවරට දළදා වහන්සේ අභයගිරි විහාරයේ සිට මහා විහාරය වෙත ද මහා පෙරහැරකින් වැඩම වා ඇත. ලංකාවේ දළදා ඉතිහාසය තුළ දළදා වහන්සේ සහ වැස්ස අතර ඇති සබඳතාව ආරම්භ වූයේ ද මෙම අනුරාධපුර යුගයේ දීය. උපතිස්ස රාජ්‍ය කාලයේ රටේ ලොකු නියඟයෙන් ඇති වූ අවස්ථාවක, රජතුමා මහා සංඝරත්නයේ උපදෙස් පරිදි දළදා වහන්සේ නගරය පුරා වැඩමවා, සජ්ඣායනා පැවැත්වූ පසු රටට මහවැසි ඇද හැලුණු බව මහාවංශයේ සඳහන් වේ. එතැන් සිට 'දළදා වහන්සේ සතු තැනට වැසි වසී ' යන විශ්වාසය ලාංකීය ජනතාව තුළ ප්‍රසිද්ධ විය.**

**එය දළදා වහන්සේ ශ්‍රී ලංකාවට වැඩම වූ පසු පෑ පළමු ප්‍රතිහාර්යය වේ.**

**මෙම කාලය තුළදී ලංකාවේ ඇතිවුන විදේශීය ආක්‍රමණ සහ දේශපාලන අස්ථාවරත්වයන් හේතුකොටගෙන හේමමාලා සහ දන්ත කුමරුන් දන්ත ධාතුන් වහන්සේ ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ රාජධානි වෙත වැඩමවීමට සිදු විය.**

## මහාවංශය (පළමු කොටස),

**රාජරත්නාකරය සහ මූලාශ්‍ර වල සඳහන් පරිදි අනුරාධපුර යුගයේ අවසානය වන විට චෝල සහ පාණ්ඩ්‍ය ආක්‍රමණ දරුණු විය. ඒ හේතුවෙන් මහා සංඝරත්නය දළදා වහන්සේගේ ආරක්ෂාව පතා එය රුහුණට (විශේෂයෙන්ම මලය රට සහ දිගුලාගල ආශ්‍රිත වනාන්තර හා කඳු මුදුන් වෙත) වැඩමවා ආරක්ෂා කරගෙන ඇත. පසුව නැවතත් බේරි ලංකාවේ රජුගේ බලය ස්ථාවර වන තෙක් දළදා වහන්සේ එහි සුරක්ෂිතව තැන්පත් කර තිබුණි.**

## පොළොන්නරුව යුගය

පොළොන්නරු යුගයේ දී චෝල සතුරන් පලවා හැර රට එක්සේසත් කළ පසු, විජයබාහු රජතුමා දළදා වහන්සේ මහත් හරසරින් පොළොන්නරුවට වැඩමවා, එහි 'අටදාගෙය' නමින් මාළිගාවක් කරවා තැන්පත් කළේය. එහි ආරක්ෂාව



වේලෙක්කාර සේනාවට භාර විය.

පසුව මහා පරාක්‍රමබාහු රජු දන්ත ධාතූන් වහන්සේ උදෙසා සුප්‍රසිද්ධ 'වටදාගෙය' නිර්මාණය කර ඇත. නිශ්ශංකමල්ල රජු විසින් ද ධාතුව තැන්පත් කිරීම සඳහා 'හැටදාගෙය' කරවා පුද පූජා කර තිබේ.



කාලිංග මාඝ ආක්‍රමණය නිසා මහා සංඝරත්නය දන්ත ධාතූන් වහන්සේ සතුරන්ගෙන් සඟවනු පිණිස කොත්මලයේ පුස්සල්පිටිය නැමති ගම්මානයේ කඳු මුදුනෙක වළලා ආරක්ෂා කළහ.



## දඹදෙණිය, යාපහුව සහ කුරුණෑගල යුගය

තුන්වන විජයබාහු රජ දන්ත ධාතූන් වහන්සේ කොත්මලයෙන් සොයාගෙන අවුත්, වඩාත් ආරක්ෂිත ස්ථානයක් වූ බෙලිගල පර්වතය මත මාළිගාවක් කරවා තැන්පත් කර ඇත. පසුව ඔහුගේ පුත් දෙවන පරාක්‍රමබාහු රජු දන්ත ධාතූන් වහන්සේ දඹදෙණියට වැඩමවා මහා පූජාවන් පැවැත්විය.

හතරවන බුවනෙකබාහු රජ දන්ත ධාතූන් වහන්සේ යාපහුව රාජධානියට වැඩමවූ නමුත් එහි ඇති වූ පාණ්ඩ්‍ය ආක්‍රමණය නිසා දන්ත ධාතූන් වහන්සේ දකුණු ඉන්දියාවට පැහැරගෙන යන ලදී. පසුව තුන්වන පරාක්‍රමබාහු රජු ඉන්දියාවට ගොස් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හරහා එය නැවත ලංකාවට වැඩමවා ගැනීමට සමත් විය.

සිව්වන පරාක්‍රමබාහු රජු කුරුණෑගලදී දන්ත ධාතූන් වහන්සේ උදෙසා තෙමහල් මාළිගාවක් කළ අතර, දළදා පූජා සංස්කෘතිය සහ චාරිත්‍ර විධි නීතිගත කිරීම සඳහා

"දළදා සිරිත" නමැති ග්‍රන්ථය සම්පාදනය කර ඇත.

## ගම්පොළ සහ කෝට්ටේ යුගය

පස්වන බුවනෙකබාහු රජුගේ කාලයේදී කුරුණෑගලින් ගම්පොළ නියම්ගම්පාය විහාරයට වැඩමවන ලදී. මෙකල වීර අලකේෂ්වර ඇමතිවරයා විසින් සතුරන්ගේ ආරක්ෂාව කරනු පිණිස දළදා වහන්සේ කෑගල්ල කඩතොළු රයිගම ප්‍රදේශවලට වැඩමවා තැබීය.

හයවන පරාක්‍රමබාහු රජු (කෝට්ටේ ස්වර්ණමය යුගය) දන්ත ධාතූන් වහන්සේ උදෙසා තෙමහල් ප්‍රාසාදයක් කරවා තැන්පත් කර ඇත. මේ පිළිබඳ පැරණි සන්දේශ කාව්‍යවල වර්ණනා කර ඇත.

## සීතාවක යුගය

කෝට්ටේ යුගය අවසානයේදී පෘතුගීසීන්ගේ බලපෑම තීව්‍ර වී දොන් ජුවන් ධර්මපාල රජු කතෝලික ආගම වැළඳගත් පසු, හිරියාලේ කිරවැල්ලේ රාළ නැමති නිලධාරියා දන්ත ධාතූන් වහන්සේ රහසිගතව සීතාවක මායාදුන්නේ සහ අලමුදුන් රාජසිංහ රජු විසින් දන්ත ධාතූන් වහන්සේගේ ආරක්ෂාව කූරගල රත්නපුර දෙල්ගමුව රජමහා විහාරයේ තිබූ කුරහන්ගලක් යට සඟවා වසර 40කට අධික කාලයක් ආරක්ෂා කර ඇත.

## මහනුවර යුගය

විමලධර්මසූරිය ප්‍රථම රජතුමා සැබෑ සිංහල රාජධානියක් ලෙස ගොඩනැගූ පසු රජතුමා දෙල්ගමුව විහාරයෙන් දන්ත ධාතූන් වහන්සේ මහත් පෙරහැරකින් මහනුවරට වැඩමවා දෙමහල් ප්‍රාසාදයක් සාදා එහි තැන්පත් කර ඇත.

වර්තමානයේ දක්නට ලැබෙන දළදා මාළිගාවේ ඇතුළු මන්දිරය (ධාතූන් වහන්සේ වැඩසිටින කොටස) ප්‍රතිසංස්කරණය කර නිර්මාණය කරන ලද්දේ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු විසිනි. මහනුවර අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු, දළදා මාළිගාවේ සුන්දරත්වය හා ගාම්භීරත්වය වැඩි කිරීම පිණිස සුප්‍රසිද්ධ

**පත්තිරිප්පුව සහ කිරි මුහුද** (නුවර වැව) නිර්මාණය කරමින් අද වර්තමාන ශ්‍රී දළදා මාළිගා සංකීර්ණයේ නිමාව සම්පූර්ණ කළේය .

අනුරාධපුර සිට මහනුවර දක්වා වූ මෙම දීර්ඝ ගමන තුළ දළදා ධාතූන් වහන්සේ යනු හුදු ආගමික වස්තුවක් පමණක් නොව ලංකාවේ රාජ්‍ය උරුමය සහ ස්වෛරීභාවය තීරණය කළ ප්‍රධානම සාධකය වූ බව පෙනේ. මහාවංශය, මන්දාම්පුර පුවත, සද්ධර්මාලංකාරය, සන්දේශ කාව්‍ය, දළදා සිරිත, පූජාවලිය නිකාය සංග්‍රහය, චූල වංශය, රාජරත්නාකරය යන කෘතීන් මූලාශ්‍රයන්වේ.

අතීත තොරතුරු කැටි කරගෙන මෙලෙසින් අප ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ හේමමාලා කුමරිය සහ දන්ත කුමරු වැඩමවාගෙන පැමිණ අනුරාධපුර සිට මහනුවර රාජධානිය වෙත ගමනය වුන පුවත මෙලෙස විදහා දැක්විය හැකයි .

# දන්ත ධාතූන් වහන්සේ භාරදීමෙන් පසු ඔවුන්ගේ ජීවිතය

## 1. රාජකීය ගෞරවය සහ ධම්මචක්ක ගේහය

දන්ත ධාතූන් වහන්සේ කිත්සිරිමෙවන් රජුට භාර දුන් පසු රජතුමා අතිශයින් පැහැදී ඔවුන් දෙදෙනාට අනුරාධපුරයේ ධම්මචක්ක ගේ හය දැනට ඇති මැදිරිගිරිය  වැනි ස්ථානයක් අසලම විශේෂ මන්දිරයක් කරවා දුන්නේය. ඔවුන් දෙදෙනා දන්තධාතූන් වහන්සේගේ පළමු ගේ භාරකරුවන් ලෙස පත්කරන ලදී රජු කසිදු වැදගත් තීරණයක් ගැනීමට පෙර ඔවුන්ගෙන් උපදෙස් ලබා ගත් බව ඉතිහාසයේ සඳහන් වේ.

## 2. දළදා පෙරහැරේ සමාරම්භකයන් වීම.

අද අපට දර්ශනය කරන්නා වූ මහා දළදා පෙරහරේ මූලාරම්භය සිදුවූයේ මොවුන්ගේ මඟ පෙන්වීමෙනි. දන්තධාතූන් වහන්සේ අභයගිරි විහාරයට වැඩම කරවා වාර්ෂිකව පෙරහැර ප්‍රදර්ශනය කළ යුතු බවට රජුට යෝජනා කළේ දන්ත කුමරුය.  එම පෙරහැර සංවිධානය කිරීමේදී කාලිංග දේශයේ පැවති චාරිත්‍ර වාරිත්‍ර ශ්‍රී ලංකාවට හඳුන්වා දීමට හේමමාලා කුමරිය කටයුතු  කළාය.

## 3. කීරවැල්ලේ පරම්පරාවේ උපත

අතීත පොත්පත්වලට අනුව දන්ත කුමරු සහ හේමමාලා කුමරිය ලංකාවේ පදිංචි වී දරුවන්  ලැබූ අතර ඔවුන්ගේ පරම්පරාව කීරවැල්ලේ රාජ වංශය ලෙස හැඳින්වේ. පසුව ලංකාවේ රජු ඇතැම් රජවරු සහ ප්‍රභූවරුන් විශේෂයෙන්ම කෝට්ටේ යුගයේදී තමන් දන්ත හේමමාලා පරම්පරාවෙන් පැවත එන බව පැවසීමට ඉමහත් ආඩම්බරයක් දැක්වූවාය. ඔවුන්ගේ පරම්පරාවට දන්ත ධාතූන් වහන්සේ කෙරෙහි විශේෂ උරුමයක් ඇති බව එදා සමාජය පිළිගත්තේය.

## 4. අවසන් කාලය සහ කැපවීම

ඔවුන් දෙදෙනා අවසන් හුස්ම හෙළන තුරුම ලංකාව තම මව්බිම ලෙස සැලකූව අතර හේමමාලා කුමරිය ලාංකීය කාන්තාවන් අතර ඉතා ජනප්‍රිය වෙමින් ඇය ඔවුන්ට බුදුදහම සහ ශිල්ප ශාස්ත්‍රය ඉගැන්වීමට කටයුතු කළ බව කියැවේ. ඔවුන්ගේ මරණයෙන් පසුව ඔවුන් ජීවත් වූ ප්‍රදේශවල ඔවුන් වෙනුවෙන් ස්මාරක පවා ඉදි වූ බව ඔවුන් දෙදෙනා දේවත්වයෙන් සලකා  ගරු කළ බව ඇතැම් පොත්පත් වල සඳහන් වෙයි.

## හේමමාලා කුමරියට පිරිනැමූ රාජකීය උපකාර සහ උපහාර

### 1."රාජ්‍ය දියණියකගේ" ගෞරවය පිරිනැමීම.

කිත්සිරිමෙවන් රජතුමා හේමමාලා කුමරියට සැලකුවේ සාමාන්‍ය අමුත්තියක් ලෙස නොව කාලිංගයෙන් පැමිණි තම සොහොයුරියක හෝ රාජ්‍ය දියණියක ලෙසයි.

■ රාජකීය නඩත්තුව

ඇයගේ සහ දන්ත කුමරුගේ පෞද්ගලික අවශ්‍යතා සහ ආරක්ෂාව වෙනුවෙන් වෙනමම රාජකීය නිලධාරීන් පිරිසක් පත් කළ බව කියැවේ.

■ රන් ආභරණ සහ වස්ත්‍ර

ඇය බමුණු වෙසින් පැමිණි නිසා ඇයට හිමි රාජකීය තත්වය නැවත ලබාදීමට රජතුමා වටිනා වස්ත්‍රාභරණ සහ රන් ආභරණ පූජා කළේය.

### 2.දන්ත ධාතූන් වහන්සේ සමග ඇති අවියෝජනීය බැඳීම

රජතුමා ආකාරයට දන්ත ධාතූන් වහන්සේ සහ හේමමාලා කුමරිය අතර ඇත්තේ වෙන්කර නොහැකි බැඳීමක් බව.

■ විශේෂ අවසරය

ඕනෑම අයෙකුට දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා ගැනීමට අවස්ථාව ලැබුණේ රජුගේ අවසරය මත වුවත් හේමමාලා කුමරියට ඕනෑම වෙලාවක දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටි මන්දිරයට ඇතුළු වීමට රජු විශේෂ අවසරයක් දී තිබුණි. එසේම දන්ත ධාතූන් වහන්සේ උදෙසා කෙරෙන දෛනික පූජාවන් මෙහෙයවීමේ සහ ඒවා අධීක්ෂණය කිරීමේ පූර්ණ බලය ඇයට පවරා තිබුණි.

### 3.ගම්වර සහ පිරිවර ලබාදීම

ඇයගේ සහ දන්ත කුමරුගේ අනාගත පරම්පරාවල සුභ සිද්ධිය උදෙසා රජතුමා විශාල භූමි ප්‍රාමාණයක් පූජා කළේය.

■ **කීරවැල්ලේ උරුමය** අතරින් ප්‍රධාන වන්නේ කීරවැල්ලේ ප්‍රදේශයයි. මෙහිදී ඇයට තමන්ට රිසි පරිදි පාලනය කළ හැකි කුඩා පාලන ඒකකයක් සහ ඇයගේ ආරක්ෂාවට වෙනමම සේනාවන් ලබා දී තිබුණි.

■ කාලිංග ශිල්පන්

ඇයට සහාය වීමට කාලිංග දේශයෙන් පැමිණි අනෙකුත් ශිල්පනි සහ පිරිස පදිංචි කරවා ඔවුන්ගේ නායකත්වය ඇයට භාර කිරීම.

**4.අධ්‍යාත්මික සහ සමාජීය ගෞරවය**

ලංකාවේ කාන්තාවන් හේමමාලා කුමරියව සැලකුවේ ශක්තිමත් කාන්තාවකගේ ආදර්ශයක් ලෙසයි.

■ කාන්තා නායකත්වය

අනුරාධපුර යුගයේ දී කුලකාන්තාවන්ට ශිල්ප ශාස්ත්‍රය ඉගැන්වීමට සහ ඔවුන්ට බුදු දහම පිළිබඳ අවබෝධය ලබාදීමට ඇය මැදිහත් වූ විට රජය විසින් ඒ සඳහා අවශ්‍ය සියලුම පහසුකම් සලසා දෙන ලදී.

■ ඉතිහාසයේ ස්වර්ණමය සලකුණ

මහාවංශය වැනි ඓතිහාසික ග්‍රන්ථවල ඇයගේ නම රන් අකුරින් ලියැවීමට සලස්වා ඇය කරන ලද මෙහෙය අනාගත පරපුරටත් දැන ගැනීමට සැලැස්වීම රජතුමා කළ ලොකුම උපකාරයයි.



## වර්තමාන සමාජය තුළ හේමමාලා කුමරිය ඇගයීමට ලක්වන ආකාරය

### 1.දළදා පෙරහැරේ සදාකාලික ගෞරවය

- පෙරහැර සංකේත

දළදා පෙරහැරේ ගමන් කරන ඇතැම් කලාකරුවන් සහ නර්තන ශිල්පන් දන්ත හේමමාලා දෙපළ දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවූ ආකාරය නිරූපණය කරන ප්‍රදර්ශන රථ හෝ වේශ නිරූපණ තුළින් ඔවුන්ට ගෞරවය දක්වයි.

දන්ත ධාතුව රැගෙන ඒම සිහිපත් කිරීම

කුමරිය තම කොණ්ඩය තුළ දන්ත ධාතුව සඟවාගෙන ඒම සිහිපත් කරමින් වර්තමානය පවා බෞද්ධ චිත්‍ර සහ මූර්ති ශිල්පන් ඇයව නිරූපණය කරන්නේ තාමත් ගෞරවනීය සහ පූජනීය කාන්තාවකගේ ප්‍රතිරූපයෙනි.

### 2.කලා නිර්මාණ සහ සාහිත්‍ය තුළ ඇගයීම

නූතන කලාකරුවන් හේමමාලා කුමරියව හඳුන්වන්නේ ධෛර්යවන්ත කාන්තාවකගේ පරමාදර්ශය ලෙසයි.

- ටෙලිනාට්‍ය හා චිත්‍රපට

දන්ත ධාතූන් වහන්සේගේ ඉතිහාසය පිළිබඳව කෙරෙන සෑම නිර්මාණයකම පාහේ හේමමාලා කුමරියගේ චරිතය ප්‍රධාන වේ. ඇයගේ කැපවීම වර්තමාන පරපුරට පවා ආදර්ශයක් වන අයුරින් මේ නිර්මාණ තුළින් ඇගයීමට ලක් කෙරේ.

- ගීත සහ කවි

ලංකාවේ ප්‍රසිද්ධ ගීත රචකයන් සහ කවියන් ඇයගේ භක්තිය සහ රූපාශ්‍රිය වර්ණනා කරමින් ගීත සහ කවි රාශියක් නිර්මාණය කර ඇත.

### 3. පාසල් පෙළපොත් සහ අධ්‍යාපනය

වර්තමාන අධ්‍යාපන පද්ධතිය තුළද හේමමාලා කුමරිය පිළිබඳව ඉගැන්වීම් සිදු කෙරේ.

- ඉතිහාසය විෂය

හයවන ශ්‍රේණියේ සිට ඉහළ පන්ති දක්වා ඉතිහාසය පෙළ පොත්වල ඇයගේ ගමන පිළිබඳව සඳහන් කර ඇත්තේ ඇය ලංකාවට කළ මහා මෙහෙවර ඇගයීමට ලක් කරමිනි.

- කාන්තා අභිමානය

නූතන කාන්තා දින සැමරුම්වලදී සහ විවිධ උත්සවවලදී ලංකාවට ආලෝකයක් වූ ශ්‍රේෂ්ඨ කාන්තාවන් අතර හේමමාලා කුමරියගේ නාමය පෙරමුණේ ම පවතී.




### 4. ස්මාරක සහ සිතුවම්

විවිධ විහාරස්ථානවල විශේෂයෙන්ම දළදා මාලිගාවේ ජාත්‍යන්තර බෞද්ධ කෞතුකාගාරය තුළ හේමමාලා කුමරියගේ ප්‍රතිමාවක් සහ සිතුවම් නිර්මාණය කර ඇත.


- ඇය සැමරීමට මුද්දරයක් හඳුන්වා දී ඇත




**1.අසමසම සහ භාරදූර වගකීම් තනිවම භාරගැනීම**

හේමමාලා දන්ත කුමරු සමඟ පැමිණියද, දන්ත ධාතූන් වහන්සේ සඟවා තබාගැනීමේ ප්‍රධාන වගකීම් හේමමාලා කුමරිය විසින්ම දරා තිබුණ බව සඳහන්ය .මෙහිදී දන්ත ධාතුව සතුරන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ඇය එය තැන්පත් කළේ තමන්ගේම කේශ කලාපය (හිසකෙස් කළඹ) තුළය. රාජ්‍ය දෙකක ඉරණම සහ බෞද්ධ ලෝකයේ මුදුනමල්කඩ බඳු වූ පූජනීය වස්තුවක් තමන්ගේ ශරීරය මතම තබාගෙන පැමිණීමෙන් පෙනී යන්නේ, ඇය මෙම මෙහෙයුමේ ප්‍රධාන භාරකාරිනිය ලෙස තනිවම වගකීම කරට ගත් බවයි.

**2.වංශකතාගත අවතක්සේරුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය බලපෑම**


තිස් හත් වෙනි පරිච්ඡේදය 167

ඒ රජු දවස් නව වන වස එක්තරා බැමිණියක් තොමෝ බුදු
රජහු දළදාව කලිඟු රටින් මෙහි ගෙණවා එළු දළදා වස කී පරිද්දෙන්
92 රජ තෙමේ ඒ ගෙණ බහු මාණයෙන් උතුම් පුදකොට හුදු පිළිමිණින්
93 කළ කරඬුවෙක බහා දෙවන පැතිස් රජු විසින් රාජාරාමයෙහි කරවන
94 ලද දම්සක් නම් ගෙයි වැඩුයේ යි. එතැන් පටන් ඒ ගෙය දාඨධාතුඝර
නම්වී. ඉක්බිති සම්පූර්ණ සිත් ඇති රජ තෙමේ නවලක්ෂයක් ධන
95 විසඳා දළදා මහ පෙළහර කෙළේ යි. අවුරුදූ පතා අභයගිරි විහාරයට
96 වඩාගෙණ ගොස් දන්ත ධාතුවට මෙබඳු පූජා කරව යි නියෝග කෙළේ
97 ය. ඒ රජ තෙමේ අටළොස් විහාරය ද සතුන් කෙරෙහි අනුකම්පාවෙන්
98 වැව දිය තහවුරු ද බෝ පුද ආදී අපමණ පින්කම් ද කොට අටවිසි වන
අවුරුද්දෙහි යමක් ස්වභාව නම් එහි ගියේ යි. මෙළේ යි. ඉක්බිති උහු
99 කිස් දොවුන් මල් වූ දළකඩකම් හි දක්ෂ වූ දෙටුතිස් කුමර ලක්දිව
100

අපේ ප්‍රධාන වංශකතාව වන මහා වංශයේ පවා ඇගේ නම සඳහන් නොකර, *"එක්තරා බැමිණියක් තොමෝ බුදුරදුහු දළදාව කලිඟු රටින් මෙහි ගෙණවා"* ලෙස සරලව හඳුන්වා තිබේ. සාම්ප්‍රදායික ඉතිහාසකරණය බොහෝ විට පුරුෂ මූලික ආඛ්‍යානයන් මත පදනම් වීම එයට හේතුවයි. මේ නිසා දන්ත කුමරුගේ නාමයට සාපේක්ෂව, මෙම මහා මෙහෙයුමේ ප්‍රධාන කොටස්කාරිය වූ හේමමාලා කුමරියගේ අනන්‍යතාව සහ නාමය ඉතිහාසයේ පිටු අතර සැඟවී ඇත.

**3. කාන්තාවක වුවද දැක්වූ අසමසම ධෛර්යය**

එකල පැවති අතිශය දුෂ්කර සහ ප්‍රචණ්ඩ වටපිටාවක කාන්තාවක ලෙස මෙවැනි ගමනකට ඉදිරිපත් වීමම ඇගේ ධෛර්යය හා වීර්යය විදහා දක්වයි. ක්‍රිස්තු වර්ෂ (4) වන සියවසේදී භාරතය පුරා විවිධ ආගමික හිංසා, දේශපාලන සෝදිසි කිරීම් සහ චෞර භීතිකා (හොරුන්ගේ තර්ජන) පැවතිණි.

තමන් හැදී වැඩුණු රාජකීය සැප සම්පත් සහ මව්බිම සදහටම අතහැර, එවැනි දරුණු උවදුරු මැදින් සැතපුම් සිය ගණනක් වෙස්වලාගෙන පැමිණීමට ඇය සතු වූ දැඩි මානසික හා කායික ශක්තිය සැබවින්ම උපහාර ලැබිය යුත්තකි.

**4. ශ්‍රී ලංකාව කෙරෙහි තිබූ දේශපාලන හා සංස්කෘතික විශ්ලේෂණය**

කාලිංගයේ පැවති මහා යුධ වාතාවරණය හමුවේ දන්ත ධාතුව සහ තමන්ගේ ජීවිතය ආරක්ෂා කරගැනීම සඳහා ශ්‍රී ලංකාවම තෝරාගැනීම ලාංකිකයන් විසින් අපට මහා කීර්තියකි. එකල ලක්බිම ධර්මද්වීපයක් සහ ස්ථාවර බෞද්ධ රාජ්‍යයක් ලෙස භාරතය පුරා පැතිර තිබූ කීර්තිමත් භූමියකි. කාලිංගයේ ගුහ සීව රජු සහ හේමමාලා කුමරිය දැඩිව විශ්වාස කළේ සතුරන්ට ළඟාවිය නොහැකි, දළදා වහන්සේට උපරිම ගෞරවය සහ ආරක්ෂාව දිය හැකි එකම සුරක්ෂිත දේශය ශ්‍රී ලංකාව බවයි.තම දියණියව මෙලෙස වෙනත් දීපයක් කරා තනිව එවීමට එකල රජවරුන් මෙරට කෙරෙහි තැබූ විස්වාසය අප රටට මහත් ආඩම්බරයක් හා ගෞරවයකි.

**5. එකල ලංකාවේ පැවති ඉහළ කාන්තා ආරක්ෂාව**

විදේශීය තරුණ කුමරියකට මෙරටට ආරක්ෂිතව පැමිණීමට සහ ඇයව පිළිගැනීමට තරම් පරිසරයක් මෙරට එකල පැවත ඇත. අනුරාධපුර යුගයේ පැවති උසස් සදාචාරාත්මක සහ සාමකාමී සමාජ වටපිටාවකි. විදේශීය කාන්තාවක වූ හේමමාලා කුමරිය තම රටේ ඉරණම තීරණය කරන වස්තුව ද රැගෙන මෙරටට පැමිණීමට බිය නොවූයේ, එකල ලංකාවේ කාන්තාවන්ට හිමිව තිබූ ඉහළ සමාජ ගෞරවය, ස්ථාවර නීතිය සහ රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව තිබූ ප්‍රායෝගික පැහැදීම නිසාවෙනි.

## තොරතුරු සොයාගත් සාහිත්‍ය මූලාශ්‍ර


- මහාවංශය
- දාඨා වංශය
- දළදා සිරිත
- චූලවංශය
- වන්නි රාජාවලිය
- පාහියන් හිමිගේ   දේශාටන වාර්තාව
- මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ පර්යේෂණ කෘති
- මහාචාර්ය මැන්දිස් රෝහණදීර මහතාගේ දළදා ඉතිහාස විමර්ශනය


**නිමි**











# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-499-5